ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022 - 11 - 22 |

පැමිණිලිකරු : එම්.පි.එම්.පද්මසිරි ඇතුළු පිරිස,
තො.147, ඉහළ බෝපිටිය,
කඩුවෙල.

වගඋත්තරකරුවන් : 01 අධ්‍යක්ෂ ජනරාල්,
කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව,
කොළඹ 01.

02 අධ්‍යක්ෂ ජනරාල්, නාගරික සංවර්ධන අධිකාරිය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

<u>පැමිණිලි අංක : HRC/370/16</u>

**පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම :-**

පැමිණිලිකරුවන් සිය පැමිණිල්ල මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනුකරමින් දක්වා ඇත්තේ තමන් ක්ෂේත්‍ර සහකාර තනතුරුට නාගරික සංවර්ධන අධිකාරියේ සේවයට බැඳුණු බවත් මෙම තනතුරේ වසර 15 ක් සේවය කිරිමෙන් පසු සහකාර ඉඩම් නිලධාරි තනතුරට උසස්වීම් ලැබීමට හිමිකම් පැවති බවත් නමුත් මේ දක්වා පැමිණිලි පාර්ශවයට එකී හිමිකම ලබාදී නොමැති බවත් ඒ අනුව දිගින් දිගටම තම අයිතිවාසිකම් වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝනය කරමින් පවතින බවයි. එසේම ආයතනය තුල මේ වන විට නිත්‍යානුකූල නොවන බඳවා ගැනිම් හා උසස්කිරිම් සිදුකරන බවත් ඒ හේතුවෙන් තමන් තවදුරටත් වෙනස් කොට සැලකිමට හා හිංසනයට ලක්වන බවත්, නිවැරදි වැටුප් තලයන්හි හා සේවා ගණයන්ට අදාල බඳවා ගැනිම් හෝ උසස්වීම් ලබා නොදිම තුලින් රාජ්‍ය සේවය තුල තම ගරුත්වයට හානි සිදුවන ආකාරයෙන් වගඋත්තරකාර පාර්ශවය ක්‍රියා කරන බවත් දක්වා ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / Email } sechrcsl@gmail.com

වගඋත්තරකරුගේ කරුණු දැක්වීම

ඉහත පැමිණිල්ල සම්බන්ධයෙන් දෙවන වගඋත්තකාර පාර්ශවය මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ දන්වා ඇත්තේ මේ දක්වාම ආයතනය තුල බඳවා ගැනීමේ පටිපාටිය සකසා නොමැති බවත් පැමිණිලිකරුවන්ගේ ගැටළුව ඇතුළු තවත් බෝහෝ ගැටළු සම්බන්ධයෙන් තමන් 1වන වගඋත්තරකාර කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් ලිඛිතව උපදෙස් අපේක්ෂා කර ඇති බවත් මේ දක්වා එකී උපදෙස් ලබා දී නොමැතිවීම හේතුවෙන් පැමිණිලිකරුවන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමේ හැකියාව අහිමි වී ඇති බවයි.

පැමිණිල්ල සම්බන්ධයෙන් පළවන වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් දන්වා ඇත්තේ වගඋත්තරකාර නාගරික සංවර්ධන අධිකාරිය මේ දක්වා සිය සේවක සංඛ්‍යාව අනුමත කොට ගෙන නොමැති බවත්. ඒ හේතුවෙන් ඒ ඒ අවස්ථාවලදී විවිධ ගැටළු සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරි විසින් පළමුවන වගඋත්තරකරු වෙතින් උපදෙස් අපේක්ෂා කොට ඇති නමුත් ඉහත කරුණු අනුව සේවක සංඛ්‍යාව සඳහා නිත්‍යානුකූලව අනුමැතිය ලබා ගන්නා තුරු බඳවා ගැනීම් උසස්කිරීම් සම්බන්ධයෙන් නිත්‍යානුකූලව ක්‍රියාත්මක වීමේ හැකියාවක් නොමැති බව දන්වා ඇත.

මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇති කරුණු.

පැමිණිලිකරුවන් නාගරික සංවර්ධන අධිකාරියේ ක්ෂේත්‍ර සහකාරවරයෙක් ලෙස ස්ථිර සේවයේ නියුතු පිරිසක් වේ. එම තනතුරේ සේවය වසර 15ක් කරනු ලැබීමෙන් පසු සහකාර ඉඩම් නිලධාරි තනතුරට උසස්වීම් ලැබීමට එතෙක් පැවති හිමිකම් අහිමි වී ඇති බවට පැමිණිලිකොට ඇත. යම් ආයතනයක් තුල යම් සෙවක කොටසක් ගැටළුවක් තුල ක්ෂේත්‍රගතවී සිටිනම් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම එකී ආයතන ප්‍රධානින්ගේ නිත්‍යානුකූල වගකිම හා යුතුකම් විය යුතුය. විශේෂයෙන්ම රාජ්‍ය සේවය තුල රාජකාරි අනෘජතිකර සේවක සංඛ්‍යාවක් සිටිම පලදායි සේවා සැපයිමකට ඍජුවම බලපානු ලබන අතර සේවක අයිතිවාසිකම් සුරක්ෂිත කිරිම පැහැදිලි මූලික අයිතියක් ආරක්ෂා කිරිමක් ලෙස අර්ථකථනය කල හැකිය.

2006 වසරේදි රාජ්‍ය සේවය තුල වැටුප් හා සේවක සංඛ්‍යා සම්බන්ධයෙන් වන සංශෝධනයන් ප්‍රකාරව නොපමාව සියළු රාජ්‍ය ආයතන තුල සේවක ව්‍යවස්ථා ප්‍රතිව්‍යුහගත කිරිම සිදු කල යුතු වුවත් ප්‍රශ්නගත වගඋත්තරකාර ආයතනය තුල මේ දක්වාම එනම් වසර 15කට අධික කාලයක් තුල මෙකී ප්‍රතිව්‍යුහගත කිරිම සිදු නොකිරිම දැඩි මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් ලෙස නිරීක්ෂණය වේ. මේ වන විටත් පැමිණිලිකරුවන් වසර 15කට අධික සේවා කාලයක් කිසිදු උසස්වීමක් නොමැතිව එකම සේවා ගනය යටතේ එකම තනතුරක ඒකාකාරිව සේවය කරන බවට කරුණු අනාවරණය වී ඇත. තවදුරටත් වගඋත්තරකරුවන්ගේ නොකර හැරිම තුල මෙම සේවක පිරිසට කිසිදු උසස්වීමක් හෝ පෞද්ගලික වැටුප් ඉහළ යාමකින් තොරව විශ්‍රාම ගැනීමට වුවද

සිදුවිමේ අවධානම පැවතිය හැකිය. සමස්ථ රටක් තුල ක්‍රියාත්මක වනු ලබන එක් රාජ්‍ය ආයතනයකට තම ආයතනය තුල සිටින ඉතා සුළු සේවක පිරිසකට අදාල සේවක අයිතිවාසිකම් ආරක්ෂා කොට දීමට ඒ වෙනුවෙන් ක්‍රියාත්මක විමට අපෝහොසත් වන්නේ නම් එවැනි ආයතනයක් තුල රටට ජනතාවට කුමන ආකාරයෙන් මෙහෙවරක් විය හැකිද යන ගැටළුව මතුවිය හැකිය.

ඒ අනුව ඉහත සියළු කරුණු සලකා බැලීමේදී වගඋත්තරකාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් දිගින් දිගටම තමාට පැවරී ඇති නිත්‍යානුකුල රාජකාරින් නොකර හැරීමක් සිදුකරමින් පවතින බවත් එකී නොකර හැරීම තුල පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් දිගින් දිගටම උල්ලංඝනය වෙමින් පවතින බවටත් තිරණය කරමි.

එම නිසා ඉතා කඩිනමින් වගඋත්තරකාර ආයතනය තුල සේවක සංඛ්‍යාව හා සේවා ව්‍යවස්ථාව අදාල බලධාරි ආයතනයන් වෙත යොමු කරමින් අනුමත කොට ගැනීමට කඩිනමින් ක්‍රියා කල යුතු බවට වගඋත්තරකරුවන්ට නිර්දේශ කරනු ලබයි.

2022. 12. 27 දිනය පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබිමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක විම හෝ නොවිම සම්බන්ධයෙන් පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුල කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාල දැනුම්දීම් සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු( විශ්‍රාමික)
සභාපතිනි,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මා...
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමි..
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා

ම.හේ. නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව